**මහර ප්‍රාදේශීය සභාව - 2020**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **තත්ත්වාගණනය කළ මතය**

මහර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛනසැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණ 1.2.1 (අ) , 1.2.1 (ඇ) ඡේදයන්හි නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

1.6.1. **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

---

| **අදාළ ප්‍රමිතියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 3.6 | ප්‍රවර්තන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලට අදාල කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා පෙර වූ සමාන කළහැකි කාලපරිච්ඡේදය සම්බන්ධව සැසඳියහැකි තොරතුරු තුලනාත්මකව දැක්වීම. | ඉදිරි වර්ෂ වලදී මේ පිළිබඳව සැළකිල්ලට ගෙන කටයුතුකරමි. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. |
| 3.20 | භාවිත කළ වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය හා භාවිතා කළ ක්ෂය කිරීමේ අනුපාතය | | |

1.6.2. **ගිණුම්කරණ අඩුපාඩු**

---

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අංක 2155/8 හා 2019 දෙසැම්බර් 24 දින අති විශේෂ ගැසටපත්‍රය මඟින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 83(II) අනුව ප්‍රාදේශීය සභා නිලධාරීන් හා සේවකයන් ගෙවියයුතු | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි | ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අනුව වෙනම සේවක ණය අත්තිකාරම් ගිණුමක් පවත්වාගත යුතු |

| | | | |
|---|---|---|---|
| | සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | | වේ. |
| (ආ) | එකතු වටිනාකම රු.574,447,481 ක් වූ ප්‍රත්‍යාගණනය කරන ලද දේපල, පිරියත හා උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයට ක්ෂය කිරීම් කර නොතිබුණි. | නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ රීති පිළිබඳ පැවැත්වූ පුහුණු වැඩසටහන් වල හා රැස්වීම් වලට අනුකූලව 2020 වර්ෂය නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වා දුන් වර්ෂය බැවින් එම වර්ෂයට ගණනය නොකරන ලදී. | ක්ෂය කළයුතු දේපල, පිරියත හා උපකරණ නියමිත ක්ෂය රේටයන්ට අනුව ක්ෂය කළයුතු වේ. |
| (ඇ) | දේපල, පිරියත හා උපකරණ අයිතම 32 ක් ප්‍රත්‍යාගණනයකර ගිණුම්ගතකර නොතිබුණි. | එම ස්ථාවර වත්කම් අයිතම තක්සේරු කර ගිණුම්ගත කිරීම ඉදිරියේදී සිදුකරනු ඇත. | සභාව සතු සියළු දේපල, පිරියත හා උපකරණවල වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඈ) | ස්ථාවර තැන්පත් පොළිය රු.926,613 ක් ලෙස ගිණුම් වල දක්වා තිබුණද නිවැරදි ස්ථාවර තැන්පත් පොළිය රු.823,287 ක් වූයෙන් රු.103,326 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. | වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළිය නිවැරදිව ගණනයකර ගිණුම්ගත කළයුතු වේ. |
| (ඉ) | ආයුර්වේද තොග ගිණුම සකස් කිරීමේදී ප්‍රවර්තන වර්ෂයේ පාරිභෝජනය කළ තොග වටිනාකම රු.1,108,230 ක් ලෙස සටහන්කර තිබුණද සත්‍ය පාරිභෝජන තොගය රු.1,033,609 ක් වූයෙන් වෙනස රු.74,621 ක් විය. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුව ලැබෙන ඉතිරි ආයුර්වේද තොගය හා 2020.01.01 දිනට තොගය අනුව ගණනය කිරීමෙන් පරිභෝජනය කළ තොගය ලබා ගන්නා ලදී. | නිවැරදි තොග වාර්තා පවත්වා ගතයුතු වේ. |
| (ඊ) | ජර්නල් සටහන් 1 මගින් ආරම්භක ශේෂ ගිණුම්ගතකර තිබුණද පෙර නොපැවති සංචිත හා වෙන් කිරීමේ ගිණුමේ රු.26,364,842 ක ආරම්භක ශේෂයක් සටහන්කර තිබුණි. මෙම ශේෂය තුල ලැබියයුතු රු.69,203,620 ක් හා ගෙවියයුතු රු.42,388,781 ක ශේෂයක් තිබූ අතර පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අංක 15.13 ට හා | නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ රීති පිළිබඳ පැවැත්වූ පුහුණු වැඩසටහන්වල හා රැස්වීම්වලට අනුකූලව ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සකසන ලදී. | ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කළයුතු වේ. |

15.1 නියමයන්ට පටහැනිව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයට ගලපා තිබුණි.

### 1.6.3. නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව තැන්පත් වටිනාකම රු.43,381,673 ක් හා උපලේඛනය අනුව ශේෂයන්ගේ වටිනාකම රු.13,443,477 ක් වූයෙන් රු. 29,938,196 ක වෙනසක් විය. | තැන්පත් හා හිඟහිටි වරිපනම් ගිණුම්වලට නිවැරදිම ශේෂ හඳුනාගත නොහැකි වූ අතර නිවැරදි ශේෂ හඳුනා ගැනීමෙන් අනතුරුව නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,463,249 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,761,396 ක් විය.

### 2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

#### 2.2.1 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ව්‍යාපාර හිමියන් 43 දෙනෙකුගෙන් ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.98,000 ක් අයකර ගැනීමට කටයුතු කර නො තිබුණි. | 2020 වර්ෂයේ පැවති හිඟ මුදල් වන රු.58,000 ක මුදල අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පැවතියද පවත්නා කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් ඊට බාධා මතුව ඇත. | හිඟ බදු අයකිරිමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කළයුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු රු.6,915,542 ක්ව තිබුණි. | සැලැස්ම අනුව හිග බදු අයකිරිමට කටයුතු කර ඇත. | හිඟබදු අයකිරිමේ ක්‍රමවේදය වැඩිදියුණු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හිඟහිටි වරිපනම් බදු වට්නාකම මූලා ප්‍රකාශන අනුව රු 5,366,123 ක් සහ උපලේඛනය අනුව රු. 6,912,534 ක් වූයෙන් 1,546,411 ක වෙනසක් නිරීක්ෂණය විය . | හිඟහිටි වරිපනම් ගිණුම්වලට නිවැරදිම ශේෂ හඳුනාගත නොහැකි වූ අතර නිවැරදි ශේෂ හඳුනා ගැනීමෙන් අනතුරුව නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතු වේ |

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 **වත්කම් කළමනාකරණය**

-----------------------------

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පොදු ඉඩම්වල අයිතිය හා ආරක්ෂාව තහවුරුකර නොතිබීම හේතුවෙන් වැලිපිල්ලැව HPT වත්තෙහි අක්කර 1 පර්චස් 26 ක් වූ ඉඩම් කොටසක් බාහිර පුද්ගලයන් විසින් අනවසරයෙන් අල්ලාගෙන භුක්ති විඳිමින් පැවතුණි. | මෙම භූමියේ සන්තකය ආපසු ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමි. | පොදු ඉඩම් වල ආරක්ෂාව තහවුරු කළයුතු වේ. |
| (ආ) | "බිලූමවුන්ටන්" ආයතනයෙන් පොදු ඉඩම් ලෙස සභාවට ලද පර්චස් 41.40ක් විශාල වූ ඉඩම වතුර වලක් සහිත ඉඩමක් වූ අතර එය පොදු ඉඩමක් ලෙස යොදාගැනීමේ අපහසුතාවයක්ද පැවතුණි. තවද එහි ඔප්පුව සභාවට ලබාගෙන නොතිබුණි. | මෙම භූමියට අදාල ඔප්පුව ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමේදී මෙම භූමියට අදාලව ඔප්පු සකස් කෙරුණු බවටත්, මේ වන විට බිලූ මවුන්ටන් ආයතනය අක්‍රියව පවතින බවට තොරතුරු ලැබුණි. ඒබැවින් තව දුරටත් මේ සඳහා වන ඔප්පුව ලබා ගැනීමට කටයුතු කරනු ලබන අතර එසේ කළ නොහැකි වුවහොත් ප්‍රකාශන ඔප්පු සකස් කිරීමට කටයුතු කරනු ඇත. | පොදු ඉඩම සංවර්ධන කටයුතු වලට යොදාගතහැකි ඉඩමක් වියයුතු අතර අයිතිය තහවුරු කළහැකි ඔප්පුවක් තිබිය යුතු වේ. |